ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ කේන්ද්‍රස්ථානය සමඟ එක්වීමට ඔබටත් අනගි අවස්ථාවක්

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ ස්ථාපිත ශ්‍රී ලංකා මහ බැංකුව දිවයිනේ ප්‍රමුඛතම මූල්‍ය ආයතනය වේ. විශිෂ්ට නායකත්ව ගුණාංගයන්ගෙන් හෙබි, ප්‍රතිඵල අරමුණු කර ගත් කාර්යය ප්‍රවේශයකින් යුතු, කැපවීමක් ඇති සහ කණ්ඩායම් හැඟීමකින් වැඩ කිරීමේ කැමැත්ත ඇති පළපුරුදු වෘත්තිකයන් මහ බැංකුවට අවශ්‍යව ඇත.

මෙහෙයුම් අවදානම් කළමනාකරණ විශේෂඥ තනතුර (කොන්ත්‍රාත් පදනම මත)

කාර්යය / වගකීම් :

- ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මෙහෙයුම් අවදානම් පරිසරය පිරික්සීම
- පූර්ව පළපුරුද්ද ඇසුරින් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි දෙපාර්තමේන්තු සඳහා විස්තීර්ණ අවදානම් ඇගයීම් සිදු කිරීම සහ එවැනි ඇගයීම් යාවත්කාලීන කිරීම සඳහා අඛණ්ඩ ක්‍රියාවලියක් සැකසීම
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැනට අනුගමනය කරනු ලබන මෙහෙයුම් අවදානම් කළමනාකරණ ශිල්පීය ක්‍රම/භාවිතයන් පිළිබඳ දැනුම බෙදා ගැනීම සහ අදාළ පාර්ශවකරුවන් අතර නිරන්තර දැනුවත්භාවය ඇති කිරීම
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැනට අනුගමනය කරන අවදානම් කළමනාකරණ ක්‍රමවේදයන්/භාවිතයන් වැඩිදියුණු කිරීමට හැකි සෑම විටක දී ම නවීන ප්‍රවණතාවලට අනුගත වීම සඳහා මනා කර්මාන්ත පරිචයන් විශ්ලේෂණය කිරීම
- ශ්‍රී ලංකා මහ බැංකුව වෙත බලපෑම් කළ හැකි නැගී එන අවදානම් තත්ත්වයන් හඳුනා ගැනීම
- මෙහෙයුම් කටයුතු, ක්‍රියාවලි සහ අවදානම් අවම කිරීමෙහි ලා ගනු ලබන පිළියම්වල කාර්යක්ෂමතාව, ඵලදායිතාවය වැඩි දියුණු කිරීම සඳහා අතිරේක පාලනයන් සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම
- මෙහෙයුම්, මූල්‍ය හා උපායමාර්ගික අවදානම් සංරචක එකිනෙක සම්බන්ධ කිරීමෙන් ව්‍යවසාය අවදානම් කළමනාකරණ රාමුව (ERM framework) සම්පූර්ණ කිරීම
- ව්‍යවසාය අවදානම් කළමනාකරණ රාමුව ආශ්‍රිත පද්ධති භාවිතා කරන්නන් පුහුණු කිරීම
- අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පූර්ණ ක්‍රියාකාරී මෙහෙයුම් අවදානම් වෘත්තිකයන් ලෙස පුහුණු කිරීම

අවශ්‍ය අවම සුදුසුකම් සහ පළපුරුද්ද:

- **අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම්:**

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලැබූ අවම වශයෙන් දෙවන පංතිය ඉහළ පෙළ සාමාර්ථයක් (2nd Class Upper) හෝ ශ්‍රේණි ලකුණුවල සාමාන්‍යය (GPA) උපරිම 4.0 කින් අවම වශයෙන් 3.5 ක් හෝ බර තැබූ සාමාන්‍යය ලකුණු (WAM) අවම වශයෙන් 75% ක් සහිත, පහත සඳහන් විෂය ධාරාවන්ගෙන් එකක් සඳහා ලබා ගත් විශේෂවේදී උපාධියක් (පාඨමාලා කාලය අවම වශයෙන් වසර 03 ක් විය යුතු ය.) හෝ පහත සඳහන් විෂය ධාරාවන්ගෙන් එකක් සඳහා ලබා ගත් ශාස්ත්‍රපති උපාධියක් හෝ ඊට ඉහළ මට්ටමක පශ්චාත් උපාධියක් (පාඨමාලා කාලය අවම වශයෙන් වසරක)

- අවදානම් කළමනාකරණය (Risk Management)
- මූල්‍ය/ගිණුම්කරණය (Finance/Accounting)
- සංඛ්‍යානය/ගණිතය (Statistics/Mathematics)
- ව්‍යාපාර පරිපාලනය (Business Administration)/ ව්‍යාපාර කළමනාකරණය(Business Management)/ ව්‍යාපාර අධ්‍යයනය (Business Studies)

සහ පහත සඳහන් සුදුසුකම් වලින් එකක්;

අ. පහත සඳහන් ඕනෑම ආයතනයකින්, "අවදානම් කළමනාකරණය" ආශ්‍රිත පාඨමාලාවක් සම්පූර්ණ කිරීමෙන් පසු එම ආයතනය මගින් ලබාගත් වෘත්තීය (Professional)/ආශ්‍රිත (Associate)/අධි (Fellow) සාමාජිකත්වය,

- එක්සත් රාජධානියේ මෙහෙයුම් අවදානම් ආයතනය (The Institute of Operational Risk)
- ඇමරිකා එක්සත් ජනපදයේ වෘත්තීය අවදානම් කළමනාකරුවන්ගේ ජාත්‍යන්තර සංගමය (Professional Risk Managers' International Association)
- එක්සත් රාජධානියේ අවදානම් කළමනාකරණ ආයතනය (Institute of Risk Management)
- ඇමරිකා එක්සත් ජනපදයේ අවදානම් කළමනාකරණ සංගමය (Risk Management Society)

හෝ

ආ. එක්සත් රාජධානියේ ජාත්‍යන්තර අනුකූලතා සංගමයෙන් (International Compliance Association) විසින් පවත්වනු ලබන "පාලනය, අවදානම් සහ අනුකූලතාව" ("Governance, Risk and Compliance") පිළිබඳ පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු එම ආයතනයෙන් ලබාගත් වෘත්තීය (Professional)/ආශ්‍රිත (Associate)/අධි (Fellow) සාමාජිකත්වය

හෝ

ඇ. ඇමරිකා එක්සත් ජනපදයේ ආයු ගණක සංගමයේ (Society of Actuaries) වරලත් ව්‍යවසාය අවදානම් විශ්ලේෂකවරයෙකු වීම (Chartered Enterprise Risk Analyst)

හෝ

ඈ. ඇමරිකා එක්සත් ජනපදයේ රක්ෂණ අධ්‍යාපනය සහ පර්යේෂණ සඳහා වූ ජාතික සන්ධානයේ (National Alliance for Insurance Education and Research) සහතිකලත් අවදානම් කළමනාකරුවෙකු වීම (Certified Risk Manager)

- **පළපුරුද්ද :** පිළිගත් මූල්‍ය/වාණිජ ආයතනයක, පහත සඳහන් දෑ ද ඇතුළුව මෙහෙයුම් ක්‍රියාකාරකම්, ඒ හා සම්බන්ධ අවදානම් සහ අවදානම් පාලනයන් පිළිබඳව යහ දැනුමක් සහිතව වසර දහය (10) කට නොඅඩු සේවා පළපුරුද්දක් තිබීම
  - අවදානම් කළමනාකරණය/අනුකූලතාවය/විගණන කාර්යයන් පිළිබඳ ශක්තිමත් පසුබිමක් සහිතව ව්‍යවසාය අවදානම් කළමනාකරණය (ERM) සහ ව්‍යවසාය අවදානම් කළමනාකරණ යෙදුම් පිළිබඳ දැනුම.
  - අදාල ක්ෂේත්‍රයේ දැනුම සහිතව ශ්‍රී ලංකා මහ බැංකු මෙහෙයුම් සම්බන්ධයෙන් ඇති දැනුවත්භාවය (වඩාත් සුදුසු ය.)
  - විශ්ලේෂණාත්මක කුසලතා සහ තොරතුරු තාක්ෂණ දැනුම සමඟ දැඩි ඒත්තු ගැන්වීමේ/සාකච්ඡා කිරීමේ කුසලතා
  - සන්නිවේදන, අන්තර් පුද්ගල සහ ඉදිරිපත් කිරීමේ කුසලතා
- **වයස :** 2020 දෙසැම්බර් 21 දිනට වයස අවුරුදු 40 ට අඩු නොවිය යුතු අතර අවුරුදු 50 ට වැඩි නොවිය යුතු ය.
- **සේවා නියුක්තිය :** කොන්ත්‍රාත් පදනම මත වසර තුන (03) ක් සඳහා
- **වැටුප් සහ වෙනත් ප්‍රතිලාභ** : රු. 400,000 ක (බදු ගෙවිය යුතු) මාසික දීමනාවක් සහ සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා දායකත්වය

තාක්ෂණික අවදානම් විශේෂඥ තනතුර (කොන්ත්‍රාත් පදනම මත)

කාර්යය / වගකීම් :

- ව්‍යවසාය අවදානම් කළමනාකරණයට (ERM) අදාළ මෘදුකාංග පද්ධති සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය කිරීම
- නව තොරතුරු පද්ධති පරීක්ෂා කිරීම හා ඇගයීම සහ අවදානම් සම්බන්ධ පාලනයන් නිර්දේශ කිරීම
- පවත්නා තොරතුරු පද්ධතිවල නව්‍යකරණය කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීමෙන් පසුව එම නව්‍යකරණයන් සිදු කිරීම
- තත්ත්ව සහතික කිරීමේ ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීම
- මෘදුකාංග මෙවලම්, ක්‍රියාවලි සහ ප්‍රමිතික යෙදවීම
- ව්‍යවසාය අවදානම් කළමනාකරණය ආශ්‍රිත පද්ධති නඩත්තු කිරීම හා වැඩි දියුණු කිරීම සහ එම පද්ධති භාවිතා කරන්නන් පුහුණු කිරීම
- තොරතුරු තාක්ෂණ පද්ධතිවල අවදානම් තක්සේරු කිරීම සඳහා අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සහ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම
- අභ්‍යන්තර තොරතුරු තාක්ෂණ පාලනයන් පරීක්ෂා කිරීම, සැලසුම් කිරීම හා මෙහෙයුම් ඵලදායිතාවය තක්සේරු කිරීම, අවදානමට ඇති නිරාවරණය තීරණය කිරීම සහ පිළියම් උපාය මාර්ග යෝජනා කිරීම
- ජාල හා පද්ධති අවදානම් පරීක්ෂා කිරීම, හඳුනා ගැනීම සහ ජාල ආරක්ෂා කිරීම සඳහා ප්‍රතික්‍රියාකාරී උපාය මාර්ග යෝජනා කිරීම
- සංකීර්ණ තාක්ෂණික ගැටළු අදාළ කාර්ය මණ්ඩල වෙත සරල බසින් සන්නිවේදනය කිරීම
- ශ්‍රී ලංකා මහ බැංකු මෙහෙයුම්වලට අදාළ පද්ධති ක්‍රියාවලි පිළිබඳ මනා අවබෝධයක් ඇති කර ගැනීම

අවශ්‍ය අවම සුදුසුකම් සහ පළපුරුද්ද:

- **අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම්:**

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලැබූ අවම වශයෙන් දෙවන පංතිය ඉහළ පෙළ සාමාර්ථයක් (2nd Class Upper) හෝ ශ්‍රේණි ලකුණුවල සාමාන්‍යය (GPA) උපරිම 4.0 කින් අවම වශයෙන් 3.5 ක් හෝ බර තැබූ සාමාන්‍යය ලකුණු (WAM) අවම වශයෙන් 75% ක් සහිත, පහත සඳහන් විෂය ධාරාවන්ගෙන් එකක් සඳහා ලබා ගත් විශේෂවේදී උපාධියක් (පාඨමාලා කාලය අවම වශයෙන් වසර 03 ක් විය යුතු ය.) හෝ පහත සඳහන් විෂය ධාරාවන්ගෙන් එකක් සඳහා ලබා ගත් ශාස්ත්‍රපති උපාධියක් හෝ ඊට ඉහළ මට්ටමක පශ්චාත් උපාධියක් (පාඨමාලා කාලය අවම වශයෙන් වසරක)

- තොරතුරු තාක්ෂණය (Information Technology)
- පරිගණක විද්‍යාව (Computer Science)
- පරිගණක ජාල (Computer Networks)
- තොරතුරු සුරක්ෂිතතාව (Information Security)
- තොරතුරු පද්ධති (Information Systems)
- මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව (Software Engineering)
- සයිබර් ආරක්ෂාව (Cyber Security)

සහ පහත සඳහන් සුදුසුකම් සපුරා තිබීම වඩාත් සුදුසු වේ.

අ. පහත සඳහන් ඕනෑම ආයතනයකින්, "අවදානම් කළමනාකරණය" ආශ්‍රිත පාඨමාලවක් සම්පූර්ණ කිරීමෙන් පසු ලබාගත් වෘත්තීය (Professional)/ආශ්‍රිත (Associate)/අධි (Fellow) සාමාජිකත්වය,

- එක්සත් රාජධානියේ මෙහෙයුම් අවදානම් ආයතනය (The Institute of Operational Risk)
- ඇමරිකා එක්සත් ජනපදයේ වෘත්තීය අවදානම් කළමනාකරුවන්ගේ ජාත්‍යන්තර සංගමය (Professional Risk Managers International Association)
- එක්සත් රාජධානියේ අවදානම් කළමනාකරණ ආයතනය (Institute of Risk Management)
- ඇමරිකා එක්සත් ජනපදයේ අවදානම් කළමනාකරණ සංගමය (Risk Management Society)

හෝ

ආ. එක්සත් රාජධානියේ ජාත්‍යන්තර අනුකූලතා සංගමයෙන් (International Compliance Association) විසින් පවත්වනු ලබන "පාලනය, අවදානම් සහ අනුකූලතාව" ("Governance, Risk and Compliance") පිළිබඳ පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු එම ආයතනයෙන් ලබාගත් වෘත්තීය (Professional)/ආශ්‍රිත (Associate)/අධි (Fellow) සාමාජිකත්වය

හෝ

ඇ. ඇමරිකා එක්සත් ජනපදයේ ආයු ගණක සංගමයේ (Society of Actuaries) වරලත් ව්‍යවසාය අවදානම් විශ්ලේෂකවරයෙකු වීම (Chartered Enterprise Risk Analyst)

හෝ

ඈ. ඇමරිකා එක්සත් ජනපදයේ රක්ෂණ අධ්‍යාපනය සහ පර්යේෂණ සඳහා වූ ජාතික සන්ධානයේ (National Alliance for Insurance Education and Research) සහතිකලත් අවදානම් කළමනාකරුවෙකු වීම (Certified Risk Manager)

- **පළපුරුද්ද :** පිළිගත් මූල්‍ය/වාණිජ ආයතනයක, පහත සඳහන් දෑ ද ඇතුළුව, අභ්‍යන්තර හෝ බාහිර විගණනය/ව්‍යාපාර ක්‍රියාවලි විගණනය/තොරතුරු තාක්ෂණ විගණනය, විගණන ආශ්‍රිත පාලනයන්/තොරතුරු පද්ධති අවදානම් තක්සේරු කිරීම/මෙහෙයුම් අවදානම් කළමනාකරණය සහ අනුකූලතා ආශ්‍රිත සේවාවන් පිළිබඳව වසර දහය (10) කට නොඅඩු සේවා පළපුරුද්දක් තිබීම
  - විශේෂයෙන් ම මෘදුකාංග සංවර්ධනය, විවිධ තාක්ෂණික සහ වින්ඩෝස් (Windows), යුනික්ස් (Unix), ලිනක්ස් (Linux) වැනි පරිගණක මෙහෙයුම් පද්ධති, Oracle, SQL වැනි දත්ත සමුදා කළමනාකරණ පද්ධති/මෘදුකාංග මෙවලම් හා firewalls, routers, networking protocols වැනි ජාල යටිතල පහසුකම් හා SAP, Navision වැනි ව්‍යවසාය පුළුල් යෙදවුම් සම්බන්ධයෙන් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ දැනුම
  - දත්ත විශ්ලේෂණ, Process Mining සඳහා භාවිතා කරන මෘදුකාංග, SQL/Tableau/BI වැනි මෘදුකාංග මෙවලම් සහ සයිබර් ආරක්ෂණ කළමනාකරණය පිළිබඳ දැනුම
  - තොරතුරු තාක්ෂණ පාලනය, අවදානම් කළමනාකරණය සහ අනුකූලතා (GRC) සංකල්ප සහ මූලධර්ම පිළිබඳ අවබෝධය
  - ව්‍යවසාය අවදානම් කළමනාකරණ පද්ධති සංවර්ධනය සහ යෙදුම් පිළිබඳ දැනුම
  - මහ බැංකු මෙහෙයුම් සඳහා නිරාවරණය වීම (වඩාත් සුදුසු ය.) සහ මනා සන්නිවේදන කුසලතා
- **වයස :** 2020 දෙසැම්බර් 21 දිනට වයස අවුරුදු 35 ට අඩු නොවිය යුතු අතර අවුරුදු 45 ට වැඩි නොවිය යුතු ය.
- **සේවා නියුක්තිය :** කොන්ත්‍රාත් පදනම මත වසර තුන (03) ක් සඳහා
- **වැටුප් සහ වෙනත් ප්‍රතිලාභ** : රු. 350,000 ක (බදු ගෙවිය යුතු) මාසික දීමනාවක් සහ සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා දායකත්වය

අයදුම්පත සමඟ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සනාථ කිරීමට අදාළ සහතිකවල ඡායා පිටපත් යොමු කිරීමට අයදුම්කරුවන් විසින් වග බලා ගත යුතු ය. ඉහත ලියකියවිලිවල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවක දී ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

තෝරා ගැනීමේ ක්‍රමවේදය

සම්මුඛ පරීක්ෂණ එකකින් හෝ කිහිපයක් මගින්

අයදුම්පත්

අයදුම්පත් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවිය වන **www.cbsl.gov.lk** වෙතින් බාගත කර ගත හැකි ය.

නියමිත ආකෘතියට අනුව සැකසූ, සියලු ලිපිලේඛන සහිතව නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ/මානව සම්පත් වෙත ලැබෙන සේ පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ සියලු ලිපිලේඛන සහිතව එම අයදුම්පත්වල පරිලෝකනය කරන ලද (Scanned) පිටපත් **hrd_recruitment@cbsl.lk** යන විද්‍යුත් තැපැල් ලිපිනයට, **2020 දෙසැම්බර් 21 දින හෝ ඊට පෙර** යොමු කළ යුතු ය.

අයදුම්පත් එවීමේදී "මෙහෙයුම් අවදානම් කළමනාකරණ විශේෂඥ තනතුර (කොන්ත්‍රාත් පදනම මත)/තාක්ෂණික අවදානම් විශේෂඥ තනතුර (කොන්ත්‍රාත් පදනම මත) සඳහා අයදුම්පත්‍රය" යනුවෙන් ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයේ විෂය යටතේ හෝ අදාළ පරිදි පැහැදිලිව සඳහන් කළ යුතු ය.

අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත්, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පසු ලැබෙන අයදුම්පත් සහ නියමිත ආකෘතියෙන් බැහැර වූ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අපේක්ෂිත සුදුසුකම් සම්පූර්ණ කර නොමැති තැනැත්තන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබන අතර සම්මුඛ පරීක්ෂණයේ දී අදාළ සහතිකපත්‍රවල මුල්පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන් කවර හේතුවක් යටතේ හෝ මෙම තනතුරු සඳහා පත් කර ගනු නොලබයි.

තෝරා ගැනීම සඳහා කුමන හෝ ආකාරයකින් බලපෑම් කිරීම, හෝ එසේ කිරීමට තැත් කිරීම තෝරා ගැනීමට නුසුදුසුකමක් වනු ඇත.

බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීම, බඳවා ගැනීම කල් දැමීම හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු ය. සම්මුඛ පරීක්ෂණ/ය සඳහා කැඳවීමේ දී අයදුම්කරුවන්ගේ අධ්‍යාපනික සුදුසුකම්වලින් ආවරණය වන විෂයය ක්ෂේත්‍රයන්හි අදාළ බව සහ බැංකුවේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි ඔවුන්ගේ සේවා පළපුරුද්දෙහි අදාළ බව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු ය.

අධ්‍යක්ෂ-මානව සම්පත්, ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01
දුරකථන : 011 - 2477330 ෆැක්ස් : 011 - 2477715